**රුහුණ විශ්වවිද්‍යාලය - 2017**

**---------------------------------**

රුහුණ විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත 2018 ජූලි 19 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

ප්‍රමිතයේ අරමුණු ඡේදය පරිදි මුදලින් ගලා එන ප්‍රභවයන් හා මුදල් වියදම් වූ අයිතමයන් සහ වාර්තා කරන දිනට මුදල් ශේෂයන් පමණක් ඇතුලත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවද, ඊට පටහැනි ලෙස දේපළ පිරියත අත්පත් කර ගැනීම වෙනුවෙන් සැපයුම්කරුවන්ට ඉදිරියේදී ගෙවිය යුතු රු 45,657,830 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ගලායාම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(i) වත්කම් හඳුනා ගැනීමේ නිර්නායක සම්පූර්ණ කර තිබුණු නමුත් 2016 ජූනි 30 දින අවසන් වී තිබුණු 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය (HETC) මඟින් විශ්වවිද්‍යාලයට ලබාදී තිබුණු එකතුව රු.123,325,853 ක් වූ වත්කම් ගිණුම් ගතකර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 55 වන වගන්තිය පරිදි ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක් ඉවත් කිරීමේදී එම වත්කමට අදාලව හඳුනාගෙන තිබුණු ප්‍රත්‍යගණන අතිරික්තය සමුච්චිත අතිරික්තය හෝ ඌනතාවයට මාරු කළ යුතුය. එහෙත් 2014 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කරන ලද රු.2,315,000 ක් වටිනා මෝටර් රථ තුනක් සමාලෝචිත වර්ෂය තුළ ඉවත් කිරීමේදී අදාල මෝටර් රථ සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කර තිබුණු රු.2,313,600 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) Specific Agrement and Resarch Cooperation between the Swedish International Development Corperation Agency ව්‍යාපෘතිය 2010 දෙසැම්බර් අවසන් වී තිබුණු අතර එම ව්‍යාපෘතියට අයිතිව තිබුණු රු. 6,300,000 ක් වටිනා වෑන් රථය විශ්වවිද්‍යාලය විසින් භාවිතා කරමින් පැවතියද, එය විශ්වවිද්‍යාලයට පවරාගෙන ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය සතු දේපළ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂ වලට අනුකූලව ගෙවිය යුතු වරිපනම් බදු හා අධිභාර ගාස්තු රු. 402,048 ක් සම්බන්ධයෙන් ගිණුම්වල ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේදී ලැබී තිබූ බාහිර මූලයන පාඨමාලා ආදායම රු.84,399,021 ක් තුළ ඉදිරි වර්ෂවලට අදාලව ලැබී තිබූ රු.53,084,777 ක් විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කල යුතු වුවද, රු.31,965,422 ක් පමණක් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම ගිණුමේ ශේෂය රු. 21,119,355 ක් අඩුවෙන් සහ සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාල අරමුදල් වලින් දරන ලද රු. 107,658,030 ක් අදාල වත්කම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වියදම් නොවූ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ හර ශේෂයක් (Capital Grant Unspent) ලෙස දක්වා තිබුණි.

(ඉ) 2017 අගෝස්තු 16 දින මිලදීගැනීම් වලට අදාළ ඉන්වොයිස් පත්‍රය අනුව රු.3,750,000 ක් වටිනා Automotive Test Bench නැමති උපකරණය රු.4,162,500 ක් ලෙස ගිණුම් ගත කිරීම නිසා සැපයුම්කරුවන්ට ගෙවියයුතු මුදල හා ජංගම නොවන වත්කම් රු. 412,500 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ශේෂයන් හා ඊට අදාළ විස්තරාත්මක උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.1,086,681 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.11,188,851 ක් වූ බැංකු ජංගම ගිණුම් 03 කට අදාලව ශේෂ සනාථන සහතික ඉදිරිපත් නොකෙරුණි.

**2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

2016 වර්ෂයේ අයවැය යෝජනා අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉංජිනේරු පීඨ ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ විශ්වවිද්‍යාලයට රු.මිලියන 150 ක් ලබා දී ඇතත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව එම මුදල රු.මිලියන 33 කින් ඉක්මවා ඉංජිනේරු පීඨය විසින් ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා වැයකර තිබුණි.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2017 මූල්‍ය ප්‍රකාශන අනුව විශ්වවිද්‍යාලය සමග ඇතිකරගෙන තිබුණු ගිවිසුම් හා බැඳුම්කර කඩකර තිබුණු ආචාර්යවරුන් 18 දෙනෙකුගෙන් වර්ෂ 01 සිට 15 අතර කාලපරිච්ඡේදයකට අයත් රු.20,932,217 ක් ලැබිය යුතුව තිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 135 වන වගන්තිය | විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යන පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමට තිබිය යුතු සුදුසුකම් ඇතුළත් කරමින් අතුරු ව්‍යවස්ථා පිළියෙල කර පාලක සභාව මගින් අනුමත කරගත යුතු වුවද, ආර්ථික විද්‍යා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහා ආරම්භයේ සිට එලෙස අතුරු ව්‍යවස්ථා පිළියෙල කරගෙන නොතිබුණි. |
| (ආ) 2006 අංක 06 දරන දේශීය ආදායම් පනතේ 116 වන වගන්තිය | (i) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා ගෙවනු ලබන මාසික පරිශ්‍රමික හා දීමනා එකතුව රු.50,000 ක් ඉක්මවන විට උපයන විට ගෙවීම් බදු අඩුකර මාසිකව දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළ යුතුව තිබුණද 2017 ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ ඇතැම් නිළධාරීන්ගෙන් අඩුවෙන් හා ඇතැම් නිළධාරීන්ගෙන් වැඩියෙන් බදු මුදල් අයකර තිබුණු අතර එම මුදල් පිළිවෙලින් රු.1,236,929 ක් හා රු.419,802 ක් වී තිබුණි.<br><br>(ii) උපයන විට ගෙවීම් ආදායම් බදු චක්‍ර අංක 01 හි 2 (ii) ඡේදය යටතේ නිත්‍ය සේවා නියුක්ති ලාභ යන්නට නිවාස පහසුකම්, වාහන පහසුකම්, වෛද්‍ය බිල්පත්, රක්ෂණ, විදුලිය, දුරකථන බිල් සහ සංග්‍රහ දීමනාද දක්වා තිබුණද නිලධාරීන්ගෙන් අයකළ යුතු උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී ඉහත දීමනා අදාළ කරගෙන නොතිබුණි. |
| (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය<br>xx පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | සෑම උසස් අධ්‍යාපන ආයතනයක් විසින්ම පැමිණීමේ ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර, අදාල ආයතනයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම තම පැමිණීම හා පිටවීම පැමිණීමේ ලේඛනයේ හෝ ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කළ යුතුය. කෙසේ වුවද, ඊට අනුකූලව කටයුතු නොකරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 515 කට සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.1,356,629,469 ක් ගෙවා තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 381 | රාජකාරි බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් (රාජ්‍ය ගිණුම් දෙපාර්තුමේන්තුවෙන්) අනුමැතිය ලබාගතයුතු වුවත්, 2017 වර්ෂය තුළ ආරම්භ කර තිබුණු විශ්වවිද්‍යාල රැක්කිරීම් ගිණුම හා Money Market ඉතිරි කිරීමේ ගිණුම සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කර මාස 06 කට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබුණද, බැංකුවට ඉදිරිපත් කර නොතිබුණු රු.59,702 ක් වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 571 | රඳවා ගැනීම් ගිණුමේ වසර 02 ක් ඉක්මවූ එකතුව රු.23,540,673 ක් වූ ශේෂයක් පැවති අතර ඒ පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඉ) 2015 – 09 දරන විශ්වවිද්‍යාල මුදල් අනුකමිටු තීරණය | 2006 – 2010 දක්වා ඇණවුම් කරන ලද පුස්තකාල පොත්වලට අදාළ රු.540,446 ක් වූ නිරවුල් නොකළ පොත් මිලදීගැනීමේ අත්තිකාරම් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණක වෙතින් වාර්තාවක් ලබාගෙන මුදල් අනුකමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඊ) 2015 ජුලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අත්තිකාරම් ලබාගන්නා ලද කාර්ය නිම වූ වහාම පියවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබුණු පර්යේෂණ අත්තිකාරම් රු.192,070 ක්, මිශ්‍ර අත්තිකාරම් රු.525,000 ක්, බාහිර අරමුදල් අත්තිකාරම් රු.476,818 ක් වශයෙන් එකතුව රු.1,193 ,888 ක් 2018 මැයි 31 දක්වාම පියවා නොතිබුණි. |
| (උ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු. 10,008,259,338 ක් වූ ස්ථාවර වත්කම් (පරිගණක දෘඩාංග හා මෘදුකාංග හැර) සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඌ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.307,040,172 ක් වූ පරිගණක දෘඩාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනමම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.165,850,112 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.76,040,206 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 89,809,906 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පුනරාවර්තන වියදම් සඳහා රාජ්‍ය ප්‍රදාන රු.130,674,145 කින් වැඩි වුවද, සේවක පාරිශ්‍රමික රු.176,087,719 කින් වැඩි වීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 හා 2014 වර්ෂවලදී ඌනතාවයක්ද 2015 වර්ෂයේදී අතිරික්තයක්ද 2016 හා 2017 වර්ෂවලදී නැවත ඌනතාවයක්ද ඇතිවී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය, බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා දායකත්වය ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේදී රු.2,307,417,826 ක් වූ දායකත්වය සියයට 8 කින් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.2,494,042,928 ක් වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ජංගම අනුපාතයේ 1.48:1 සිට 0.81:1 දක්වා පිරිහී තිබුණි.

## 3.3 විශ්වවිද්‍යාලයට එරෙහිව හෝ විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට විශ්වවිද්‍යාලය විසින් විවිධ පාර්ශවයන්ට එරෙහිව රු.8,409,361 ක් අයකර ගැනීම සඳහා දිසා අධිකරණවල නඩු 05 ක් ගොනුකර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයට එරෙහිව විවිධ පාර්ශවයන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 07 ක්ද, විශ්වවිද්‍යාල අභියාචනා මණ්ඩලයේ පැමිණිලි 09 ක් ද, කම්කරු විනිශ්චය සභාවේ පැමිණිලි 08 ක් ද, අභියාචනාධිකරණයේ නඩු 03 ක්, මහාධිකරණයේ නඩු 02 ක් ද, දිසා අධිකරණයේ හා කම්කරු වන්දි කොමසාරිස් හමුවේ නඩු 01 ක් බැගින්ද වශයෙන් ගොනු කරන ලද නඩු 31 ක් පැවතුණු අතර ඉන් එක් නඩුවක් සඳහා ඉල්ලා තිබුණු වන්දි මුදල රු.4,005,977 ක් වූ අතර එම මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ හෙළිදරව් කර නොතිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබුණද, ඒවා ඉටුකර ගැනීම සඳහා ඇති අවස්ථාවන් (Opportunities) සහ බාධක (Threats) පිළිබඳ මනා ඇගයීමකට ලක්කර නොතිබුණි.

(ආ) කාලීනව ලඟා කර ගත යුතු ඉලක්කයන් (Targets) ස්ථාපිත කිරීම හා එම ඉලක්කයන් සපුරා ගැනීමේ වගකීම මෙහෙයුම් මට්ටම දක්වා තර්කානුකූල පදනමකින් බෙදා හැර නොතිබුණි.

(ඇ) 2017 හා 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුම් 2017 නොවැම්බර් 06 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණද 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව පහත සඳහන් කරුණු ඇතුළත් කර එම වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර නොතිබුණි.

(i) ආයතනයේ සංවිධාන ව්‍යුහය,අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර.

(ii) අදාළ වර්ෂය සඳහා අයවැය ලේඛනය
(iii) වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම්.
(iv) ප්‍රසම්පාදන සැලැස්ම.
(v) අභ්‍යන්තර විගණන සැලැස්ම.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

------------------------------------

විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2018 වර්ෂය වන විට විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගන්නා මුළු සිසුන් සංඛ්‍යාව 1,860 සිට 2,340 ක් දක්වා වැඩිකර ගැනීමට සැලසුම් කර තිබුණි. නමුත් පීඨ 06 ක් සඳහා සැලසුම් කර තිබුණු සිසුන් සංඛ්‍යාවට වඩා සිසුන් 339 ක් අඩුවෙන් ඇතුළත් කර ගෙන තිබුණි.

(ආ) 2017 වර්ෂය වන විට උපාධි ලබා ගැනීමෙන් මාස 06 ක් තුළ සමස්ත උපාධිධාරීන්ගේ (වෛද්‍ය උපාධිධාරීන් හැර) රැකියා නියුක්තිභාවය සියයට 85 ක් දක්වා වර්ධනය කරගැනීම ඉලක්ක කරගෙන තිබුණද, ඉංජිනේරු උපාධිධාරීන් හැර අනෙකුත් සියලුම උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිභාවය සියයට 85 කට පහළ මට්ටමක වී තිබුණි. ඒ අතරින් කලා උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිභාවය සියයට 37 ක් තරම් පහළ මට්ටමක විය.

(ඇ) විශ්වවිද්‍යාලය ලෝක ශ්‍රේණිගත කිරීම් ලැයිස්තුවේ (Times Higher Educational and QS Ranking list) මුල් 2000 අතරට ගෙන ඒමට සැලසුම් කර තිබුණද එකී අරමුණ ඉටුකර ගැනීමට නොහැකිව තිබුණි. වෙබෝමෙට්‍රික්ස් ශ්‍රේණිගත කිරීම්වලට අනුව රුහුණ විශ්වවිද්‍යාලය දේශීය ශ්‍රේණිගත කිරීම් ලැයිස්තුවේ 2017 වර්ෂයේ 5 වන ස්ථානය හිමි කරගෙන තිබුණි.

(ඈ) (i) කෘෂිකර්ම පීඨයේ පශ්චාත් උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව වාර්ෂිකව සියයට 5 කින් වැඩිකර ගැනීමට අපේක්ෂා කර තිබුණද පීඨය හඳුන්වා දී තිබුණු පශ්චාත් උපාධි පාඨමාලා 07 න් පාඨමාලා 06 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට ක්‍රියාත්මක වී නොතිබුණි. ක්‍රියාත්මකව තිබුණු MSC in Crop Production Technology පාඨමාලාව සඳහාද 2015 වර්ෂයෙන් පසු සිසුන් ඇතුළත් කරගෙන නොතිබුණි.

(ii) දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මඟින් පරිපාලන කටයුතු සිදුකරනු ලබන සහතික පත්‍ර පාඨමාලා 04 ක් කෘෂිකර්ම පීඨය සඳහා හඳුන්වා දී තිබුණ ද එම පාඨමාලා 04 ම 2017 වර්ෂය අවසානය දක්වා ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) (i) යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු අධ්‍යයනාංශය සඳහා අමතර සිසුන් 25 බඳවාගැනීමට සැලසුම් කර තිබුණද බඳවා ගැනීම් සිදු කර නොතිබුණි.

(ii) ඉංජිනේරු පීඨයේ ආචාර්ය මණ්ඩලයේ තිදෙනෙකු 2017 වර්ෂය තුළදී දර්ශණපති උපාධිය (PHD) සම්පූර්ණ කිරීමට ඉලක්ක කර තිබුණත් ආචාර්යවරුන් දෙදෙනෙකු අදාළ ඉලක්කය සම්පූර්ණ කර ගෙන නොතිබුණි.

(ඊ) උපාධි පාඨමාලා 11 ක් සඳහා ඇතුළත් කර ගත හැකිව තිබුණු සිසුන් සංඛ්‍යාව 1,090 ක් වී තිබුණද සත්‍ය වශයෙන් එකී පාඨමාලා 11 සඳහා ඇතුළත් කර ගෙන තිබුනේ සිසුන් 1009 ක් පමණි. ඒ අනුව විශ්වවිද්‍යාලයට සුදුසුකම් ලබා තිබුණු තවත් සිසුන් 81 කට විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වී ගොස් තිබුණි.

(උ) පෙර වර්ෂයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ සිසුන් 36 ක් අසමත්වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ එය සිසුන් 122 ක් දක්වා ඉහළ ගොස් තිබුණි. එය විභාගයට පෙනීසිටි මුළු සිසුන්ගෙන් සියයට 35 ක ප්‍රතිශතයක් විය.

(ඌ) මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පෙර වර්ෂයේ සිසුන් 54 ක් උපාධි පරීක්ෂණය අසමත් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ එය සිසුන් 97 ක් දක්වා ඉහළ ගොස් තිබූ අතර එය විභාගයට පෙනීසිටි සංඛ්‍යාවෙන් සියයට 18 ක ප්‍රතිශතයක් විය.

(එ) වෛද්‍ය උපාධිය සඳහා උපාධි පරීක්ෂණයට පෙනී සිටි සංඛ්‍යාවෙන් 22 ක් අසමත් හෝ ඌණ සමාර්ථ ලබා තිබුණි. එය විභාගයට පෙනී සිටි සංඛ්‍යාවෙන් සියයට 30 ක ප්‍රතිශතයක් විය.

## 4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 31 දින අවසන් වී තිබුණු Specific Agrement and Resarch Cooperation between the Swedish International Development Corperation Agency ව්‍යාපෘතිය යටතේ භාවිතා කළ වත්කම් ලැයිස්තුවක් පිළියෙළ කර එම වත්කම් විධිමත් පරිදි ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ පීඨාධිපති වෙත භාරදිය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම එම කටයුතු සිදුකර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් පසු විපරම් කිරීමක්ද කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයට අයත් වරිපනම් බදු ගෙවන දේපළ 11 ක් සඳහා සමාලෝචිත වර්ෂය දක්වාම වරිපනම් බදු ඒවායේ මුල් අයිතිකරුවන්ගේ නමින් ගෙවා තිබුණු අතර එම දේපළවල අයිතිය විශ්වවිද්‍යාලය නමට පවරා ගැනීමට සහ විශ්වවිද්‍යාලය නමින් වරිපනම් බිල්පත් සංශෝධනය කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කෘෂිකර්ම පීඨයේ ඉගෙනුම ලබන 830 ක් වූ සියලු සිසුන් පරිගණක හා තොරතුරු තාක්ෂණය විෂයයක් වශයෙන් හදාරනු ලැබුවද පරිගණක විද්‍යාගාර 2 කින් සමන්විත පරිගණක ඒකකයේ සිසුන්ගේ පරිහරණය සඳහා ක්‍රියාකාරි තත්ත්වයේ තිබුණු පරිගණක සංඛ්‍යාව 06 ක් පමණක් විය. පරිගණක 19 ක් ක්‍රියාවිරහිතව තත්ත්වයේ පැවතුණි.

(ඈ) විශ්වවිද්‍යාල ගම්මාන වැඩසටහන් ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ලෙස රු.මිලියන 2,512.8 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර 2017 අයවැය ලේඛනයෙන් රු.මිලියන 50 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණි.එහෙත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබූ අතර මූල්‍ය ප්‍රතිපාදනවලින් රු.මිලියන 40 ක් වැඩසටහනේ අරමුණුවලට අනුකූල නොවන පීඨ හා පරිපාලන අංශවල ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා වෙන් කිරීමට 2017 ජූලි 10 දිනැති 370 වන පාලක සභා රැස්වීමේදී තීරණය කර තිබුණි.

(ඉ) හොංකොංහි International Economic Development and Research Center ආයතනයෙහි පවත්වා තිබුණු සම්මන්ත්‍රණයකට පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කර තිබුණු සිසුන් 04 දෙනෙකුට එම සම්මන්ත්‍රණයට සහභාගී වීමට විශ්වවිද්‍යාලය විසින් එක් සිසුවෙකුට රු.100,000 ක් බැගින් එකතුව රු.400,000 ක් උපකුලපති අරමුදලින් ගෙවා තිබුණි. විදේශගත වීම සඳහා සිසුන්ට උපදෙස් හා නිසි මඟපෙන්වීමක් විශ්වවිද්‍යාලය විසින් ලබා නොදීම හේතුවෙන් වීසා ලබා ගැනීමට නොහැකි වීම මත සම්මන්ත්‍රණයට සහභාගී වීමට තිබුණු වටිනා අවස්ථාව මඟ හැරී ගොස් තිබුණි. ඒ අනුව එක් සිසුවෙකුගෙන් රු.50,000 ක් බැගින් එකතුව රු. 200,000 ක් නැවත අයකර ගෙන තිබුණද විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණු ඉතිරි රු. 200,000 ක් වූ මුදල ආර්ථික නොවූ ගනුදෙනුවක් වී තිබුණි.

(ඊ) 2018 අගෝස්තු 02 දිනට එකතුව රු. 275,166,473 ක්වූ නිරීක්ෂණ ඇතුළත් විගණන විමසුම් 04 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි

(උ) ව්‍යාපාර පරිපාලනපති පශ්චාත් උපාධි පාඨමාලාව හදාරන ලද 37 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට එකතුව රු.3,003,300 ක් වූ උපාධි පාඨමාලා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මින් 15 දෙනෙකුගේ උපාධි සහතික පත්‍ර නිකුත් කර තිබුණි.

(ඌ) දීර්ඝ කාලයක සිට පැවත එන නොගෙවූ ශිෂ්‍යාධාර හා මහපොළ ගිණුම්වල 2017 වර්ෂයේ ආරම්භක ශේෂ පිළිවෙලින් රු.12,264,450 ක් හා රු.2,087,500 ක් වී තිබුණු අතර එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

සම සෞඛ්‍ය පීඨයට අදාළ හෙද උපාධි පාඨමාලාව 2008 වර්ෂයේදී ආරම්භ කර මේ වන විට සිසුන් කණ්ඩායම් 04 ක එකතුව සිසුන් 145 ක් උපාධිය සම්පූර්ණ කර පිටවී ගොස් තිබුණි. ඔවුන්ට වෘත්තීය පිළිගැනීම සඳහා අත්‍යවශ්‍ය වූ ශ්‍රී ලංකා හෙද සභාවේ ලියාපදිංචි සහතිකය (Accreditation) පාඨමාලාව සඳහා ලබා ගැනීමට 2017 වර්ෂය අවසානය දක්වා නොහැකි වී තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------------

පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 (ඇ) සහ 27 (1) උපවගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාල සඳහා පීඨයක් හෝ පීඨ පැවරුම් කිරීමේ බලය අමාත්‍යවරයා සතු වුවද, ඊට අනුකූල නොවන ලෙස රුහුණ විශ්වවිද්‍යාලට පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය පැවරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කර තිබූ අතර කොමිෂන් සභාවට එවැනි බලයක් තිබේද යන්න තහවුරු වන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) 1985 අංක 07 දරණ විශ්වවිද්‍යාල (සංශෝධිත) පනතේ 28 වන වගන්තිය මඟින් සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 48 (අ) 2 උපවගන්තිය ප්‍රකාරව පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයක ව්‍යුහය, බලතල, කාර්යය හා කර්තව්‍යය සහ ඒ පීඨයේ පීඨාධිපතිවරයා පත් කිරීම හෝ තෝරා පත් කර ගැනීම සඳහා වූ කාර්යය පටිපාටිය කොමිෂන් සභාව විසින් නියමාවලි මඟින් නිශ්චය කරනු ලැබිය යුතුව තිබුණි. නමුත් රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය සඳහා එලෙස නියම කරන ලද නියමාවලියක් 2018 මැයි 31 දක්වා සකස් කර නොතිබුණි.

(ඇ) ව්‍යාපාර පරිපාලනපති උපාධිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහා අයදුම්කරුවන් ඇතුළත් කර ගැනීමට පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය තුළ පොදු අතුරු ව්‍යවස්ථාවක් පිලියෙළ කර තිබුණ ද, 2017 වර්ෂය අවසානය දක්වාම ඒ සඳහා පාලක සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45 (2) උප වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථාව සකස්කිරීමේ බලය පාලක සභාවට පවරා ඇති බැවින් ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහා බල පවත්වන පීඨය විසින් සකස්කර තිබුණු පොදු අතුරු ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් පිළිගත හැකි ව්‍යවස්ථාවක්ද යන්න මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 46 (6) (VIII) උපවගන්තිය ප්‍රකාරව අධ්‍යයන පාඨමාලාවලට අයදුම්කරුවන් ඇතුළත් කර ගැනීම සඳහා තිබිය යුතු සුදුසුකම් පාලක සභාව වෙත නිර්දේශ කිරීමේ බලය සනාථන සභාව සතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි 2017 අප්‍රේල් 05 දින පවත්වන ලද 36 වන කළමනාකරණ හා මූල්‍ය පීඨයේ අධ්‍යයන මණ්ඩල සැසිය (BOS) තුලදී ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහා ඇතුළත් වීමට අවශ්‍ය සුදුසුකම් නිර්ණය කර තිබුණි.

(iii) නිර්ණය කර තිබුණු සුදුසුකම් වල අංක 03 යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනයේ විභාග උසස් මට්ටමෙන් සම්පූර්ණ කිරීම, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි පූර්ණ සාමාජිකත්වය සමග සමාන සුදුසුකම් ලෙස සලකා ව්‍යාපාර පරිපාලනපති පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකමක් ලෙස පීඨ අධ්‍යයන මණ්ඩය විසින් තීරණය කර තිබු නමුත් එය තාර්කික නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) ඉංජිනේරු පීඨය විසින් පෞද්ගලික ආයතනයකින් ගලිබවුසර් සේවාව ලබාගෙන එක් ගමන් වාරයකට රු.8,500 බැගින් ගමන් වාර 57 ක් සඳහා රු.484,500 ක් ගෙවීම් කර තිබුණි. ආරක්ෂක අංශයේ තිබුණු වාහන පැමිණීමේ පිටවීමේ ලේඛනය අනුව කිලෝමීටර් 25 ක පමණ දුරක් අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට හා අපද්‍රව්‍ය පැටවීමට හා බෑමට ගතකර තිබුණු සාමාන්‍ය කාලය විනාඩි 38 ක් තරම් පිළිගත නොහැකි කෙටි කාලයක් වී තිබුණි. ඒ අනුව අදාළ ගෙවීම් කිරීමට ප්‍රථම එහි නිවැරදිභාවය තහවුරු කරගෙන නොතිබුණු බැවින් මෙම ගෙවීම මතභේදයට තුඩුදෙන්නකි.

## 4.5 නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෛද්‍ය පීඨයට අයත් ඖෂධවේදී උපාධි පාඨමාලා මධ්‍යස්ථානයේ පරිගණක විද්‍යාගාරය සඳහා Dell වර්ගයේ පරිගණක 20 ක් 2011 මැයි 31 දින ලබාදී තිබුණි. ඉහත පරිගණක 20 න් 7 ක් පරිගණක විද්‍යාගාරය තුළ දීර්ඝ කාලයක සිට අක්‍රියව පැවති අතර තවත් පරිගණක 06 ක් අළුත්වැඩියා කටයුතු සඳහා 2017 පෙබරවාරි 23 දින වෛද්‍ය පීඨයට යවා තිබුණද 2017 ඔක්තෝබර් 11 විගණන දිනය දක්වාම නැවත ලබා දී නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දින වෛද්‍ය පීඨයට අයත් හෙද උපාධි පාඨමාලාව සඳහා රු.495,600 ක් වටිනා HP වර්ගයේ Laptop පරිගණක 07 ක් ලබා දී තිබුණද විගණන දිනය වු 2018 ජුනි 30 දක්වාම ඉන් පරිගණක 05 ක් අදාල මෘදුකාංග ඇතුළත් කර භාවිතයට ගෙන නොතිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

### (අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය

(i) ඉංජිනේරු පීඨයේ අනුමත මහාචාර්ය තනතුරු 04 ම ආරම්භයේ සිටම පුරප්පාඩු වී පැවතුණි.

(ii) විශ්වවිද්‍යාලයට අයත් පීඨ 09 හි කථිකාචාර්ය තනතුරු පුරප්පාඩු 188 ක් පැවතුණි. ඉන් වෛද්‍ය, ඉංජිනේරු සහ විද්‍යා යන පීඨවල පුරප්පාඩු ප්‍රමාණය පිළිවෙළින් 42 ක් , 25 ක් හා 33 ක් තරම් ඉහළ අගයන් ගෙන තිබුණි. 2018 මැයි 31 දක්වාද මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **අනධ්‍යයන කාර්ය මණ්ඩලය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2010 නොවැම්බර් 04 දින සිට පුරප්පාඩු වී පවතින මූල්‍යාධිකාරී තනතුර සඳහා අවස්ථා 10 කදී අයදුම්පත් කැඳවා තිබුණි. සුදුසුකම් සම්පූර්ණ කර තිබුණු අයදුම්කරුවන් තිදෙනෙකු සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට මාස 06 සිට 08 දක්වා කාලයක් ප්‍රමාද වීම හේතුවෙන් එම තිදෙනාම සම්මුඛ පරීක්ෂණ සඳහා පැමිණ නොතිබුණි. එ් අනුව සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාද පුරප්පාඩුව පුරවා ගැනීමට නොහැකිව තිබුණි.

(ii) වැඩ ඉංජිනේරු තනතුරු 02 ක 2010 වර්ෂයේ සිට පුරප්පාඩු පැවති අතර ඒ සඳහා අවස්ථා 07 කදී අයදුම්පත් කැඳවා තිබුණද, 2018 මැයි 31 දින වන විටත් අවශ්‍ය බඳවා ගැනීම් කිරීමට නොහැකිව තිබුණි.

(iii) අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මාණ්ඩලික තනතුරු 10 ක, මාණ්ඩලික නොවන තනතුරු 45 ක, සුළු සේවක තනතුරු 63 ක පුරප්පාඩු පැවතුනි. නමුත් මෙම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

(iv) අංශ 03 ක පමණක් සේවය කර තිබුණු ලිපිකාර හා සමාන්තර ශ්‍රේණිවල කාර්ය මණ්ඩල සංඛ්‍යාව 278 ක් වූ අතර එහි 20 දෙනෙකු වසර 05 සිට වසර 20 කට වැඩි කාලයක් එකම අංශයක සේවය කර තිබුණි.

(v) විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ආරක්ෂක අංශයේ කාර්ය මණ්ඩලය 124 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 94 ක් විය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 30 ක් වූ අතර එම පුරප්පාඩු සඳහා බඳවා නොගෙන 2017 ජනවාරි සිට පෞද්ගලික ආරක්ෂක සේවකයින් 65 දෙනෙකුගේ සේවය ලබා ගෙන තිබුණි. එය පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකටද වැඩි විය. එම පෞද්ගලික ආරක්ෂක සේවය සඳහා 2017 ජනවාරි සිට ජූලි දක්වා පමණක් රු.14,322,710 ක් ගෙවා තිබියදී විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නිලධාරීන්ටද අතිකාල ලෙස එම කාලපරිච්ඡේදයටම රු.7,484,926 ක් ගෙවා තිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලය ආරක්ෂක සේවාවන් ලබා ගැනීමේදී ආර්ථික වශයෙන් ඵලදායි ආකාරයට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව රුහුණ විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත විශ්වවිද්‍යාලය විසින් සිය විෂය පථයට අනුව ළඟා කර ගත යුතු අරමුණු හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ හෙයින් ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම්වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කරා ළඟාවීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී හෝ දුර්වල තත්ත්වයක පැවැති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි 28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණද, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විගණකාධිපති විසින් නිකුත් කර තිබුණු 2017 දෙසැම්බර් 29 දිනැති හා අංක විලේ/පොදු/2017/142 දරන ලිපිය පරිදි මූල්‍ය ප්‍රකාශන සමග අවශ්‍ය උපලේඛන සහ උපයෝගී ලේඛන එදිනම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව උපලේඛන සමග මූල්‍ය ප්‍රකාශන විධිමත් පරිදි 2018 අප්‍රේල් 11 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 6.2 අභ්‍යන්තර විගණනය

කාර්ය මණ්ඩලය 07 කින් යුත් අභ්‍යන්තර විගණන ඒ්කකයක් පිහිටුවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකවල කාර්යයන් සහ ඒවායේ විෂයය සීමාව ආවරණය වන ආකාරයට විශ්වවිද්‍යාලයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 134 (3) පරිදි විශ්වවිද්‍යාලයේ මුදල් කටයුතුවලට අදාල අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත යැවිය යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි.

### 6.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු **ලැබේ.**

(අ) කෘෂිකර්ම පීඨය සහ වෛද්‍ය පීඨය සඳහා භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 96 ක් හා රු. මිලියන 22 ක් ප්‍රසම්පාදන සැලසුමට ඇතුළත් කර තිබුණද ප්‍රතිපාදන වෙන්කර තිබුණේ රු.මිලියන 08 ක් හා රු. මිලියන 12 ක් පමණක් වන අතර තත්‍ය වියදම රු.මිලියන 07 ක් හා රු. මිලියන 11 ක් පමණක් වී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය සඳහා පොදුවේ ආපනශාලාවලට සුදුසු මේස හා පුටු මාදිලිය නිර්ණය කිරීමෙන් තොරව ඉංජිනේරු පීඨයේ ආපනශාලා අංක 01 සඳහා රු. 2,375,923 ක් වැය කර මිල අධික දැව මේස හා බංකු මිලදීගෙන තිබූ අතර අංක 02 ආපනශාලාවට ඉහත මිල ගණන්වලට වඩා අඩු වටිනාකම් සහිත ෆයිබර් වර්ගයේ මේස හා පුටු මිලදීගෙන තිබුණි.තවද, ඉහත මිලදී ගැනීමත් සමඟ අංක 01 ආපනශාලාවට 2013 වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු. 95,200 ක් වූ හොඳ තත්ත්වයේ තිබුණු මේස 10 ක් ඉවත් කිරීමට සිදුවී තිබුණි.

(ඇ) කෘෂි පීඨයේ 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලසුමට අනුව Desktop පරිගණක 60 ක්, Laptop පරිගණක 60 ක් Scanner 01 ක් හා UPS 10 ක් මිලදී ගැනීම සඳහා සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ කිසිවක් මිලදී ගෙන නොතිබුණි.

### 6.3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

රු.මිලියන 94 ක් වැයකර ඉදිකර තිබුණු ඉංජිනේරු පීඨයේ නව පුස්තකාල ගොඩනැගිල්ල 2015 අප්‍රේල් 22 විශ්වවිද්‍යාලයට භාරදී තිබුණද, ගොඩනැගිලි බිත්ති, කොන්ක්‍රීට් බිම් සහ කුළුණු ඉරිතැලීම් හා පිපිරීම්වලට ලක්වී තිබුණු ස්ථාන 170 ක් නිරීක්ෂණය වූ අතර පළමු මහල හා දෙවන මහලවල බිත්ති මත ජලය කාන්දුවන ස්ථාන 03 ක් නිරීක්ෂණය විය. තවද විදුලි පරිපථය විධිමත් පරිදි සකසා නොතිබුණු බැවින් විදුලි පැන්නුම් ස්විචය (Trip Switch) ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ගොඩනැගිල්ලේ සවිකර තිබූ Network Switch 3 ක් අතරින් රු. 624,094 ක් වටිනා ස්විච් Network Switch 2 ක් සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණු අතර අනෙක් ස්විචයක කොටසක් අක්‍රීය වී තිබුණි.

### 6.4 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වු වැය විෂයයන් 64 ක අයවැයගත හා තත්‍ය වියදම් අතර සියයට 25 සිට සියයට 559 ක් දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 6.5 නොවිසඳී ඇති විගණන ඡේද

ඉකුත් විගණකාධිපති වාර්තා මඟින් පෙන්වා දී තිබුණු නමුත්, පහත විස්තර දැක්වෙන විගණන ඡේද සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විශ්වවිද්‍යාලයේ අවධානය යොමු වී නොතිබුණි.

(අ) ධීවර, සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය මඟින් 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ක්‍රියාත්මක කර තිබුණු Specific Agreement on Research Co-operation Between the Swedish International Development Co-operation Agency ව්‍යාපෘතිය යටතේ උසස් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ගැනීම සඳහා කිසිදු ඇප බැඳුම්කරයකට එළඹීමෙන් තොරව තාවකාලික කථිකාචාර්යවරයෙකුට සහ ස්ථිර කථිකාචාර්යවරයෙකුට එකතුව රු. 1,740,622 ක මූල්‍යාධාර සපයා තිබුණි. එහෙත් 2017 දෙසැම්බර් 31 දක්වාම එම කථිකාචාර්යවරුන් උසස් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර සේවයට වාර්තා කර නොතිබීම හේතුවෙන් දරන ලද වියදමට කිසිදු ප්‍රතිලාභයක් විශ්වවිද්‍යාලයට ලැබී නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) (i) කෘෂිකර්ම විද්‍යා පීඨයේ ආහාර හා තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය සඳහා අවශ්‍ය විද්‍යා උපකරණ ජර්මනියේ ආයතනයකින් මිලදී ගැනීම සඳහා වසර 04 කට පෙර රු. 751,463 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද එම උපකරණ 2014 වර්ෂයේ මාර්තු දක්වාම විශ්ව විද්‍යාලයට ලැබී නොතිබූ නමුත් ඒ පිළිබඳ කිසිදු පසු විපරම් කිරිමකින් තොරව නැවත වරක් රු. 329,179 ක් වැයකර ඉන්දියාවෙන් උපකරණ ආනයනය කර තිබුණි.

(ii) එහෙත් ඇනවුම් නොකරන ලද භාණ්ඩ ලැබීම් සහ විවිධ අඩුපාඩු හේතුවෙන් එම උපකරණ විශ්ව විද්‍යාලය වෙත ලැබී සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට වසර 2 ක් ඉක්මවා තිබුණද ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි.

(iii) ඉහත ඡේද අංක (ආ) (i) දක්වා ඇති භාණ්ඩ ශ්‍රී ලංකා රේගු අධිකාරියට අයත් ඔරුගොඩවත්ත ගබඩාවේ තිබී 2016 මැයි 04 දින නිදහස් කරගෙන තිබුණි. ඒ අනුව 2013 නොවැම්බර් 25 දින සිට 2016 අප්‍රේල් 29 දක්වා දින 887 ක් භාණ්ඩ ගබඩාවේ රඳවා ගැනීමට සිදුවීම වෙනුවෙන් රු.88,700 ක ගබඩා ගාස්තුවක්ද, ගුවන්තොටුපල ගාස්තු වශයෙන් රු.30,750 ක් ද වශයෙන් එකතුව රු.119,450 ක් ගෙවීමට සිදු වී තිබුණි. එය අදාල

නිලධාරින්ගේ ප්‍රමාදය හා නොසැලකිල්ල නිසා රජයට සිදු වූ පාඩුවක් වුවද, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 (1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) ලෝක සෞඛ්‍ය සංවිධාන ව්‍යාපෘතියට අදාල වෛද්‍ය පීඨ අරමුදල් ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට රු. 1,764,410 ක ශේෂයක් පැවතුණි. 2015 සැප්තැම්බර් 09 හා 2017 ජනවාරි 17 යන දිනවල විගණනයට ඉදිරිපත් කර තිබුණු පිළිතුරු ලිපි මඟින් ඉහත අරමුදල් ගිණුමේ ශේෂය පීඨයට නව බස් රථයක් මිලදී ගැනීම සඳහා යෙදවීමට බලාපොරොත්තු වන බව දක්වා තිබුණද, 2018 මැයි 31 දින දක්වා එය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 6.6 සමාජ වගකීම් ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය නිසා සිදු වන සෘජු හා වක්‍ර සෞඛ්‍ය, පාරිසරික හා සමාජීය බලපෑම අවම කර ගැනීමට වැඩසටහන් විවිධ රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගෙන ක්‍රියාත්මක කළ හැකිව තිබුණද, විශ්වවිද්‍යාලය ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(ආ) පහත විස්තර දැක්වෙන පරිසර හිතකාමී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශ්වවිද්‍යාලයේ අවධානය යොමු වී නොතිබුණි.

(i) දැනට තහනම් කර ඇති මයික්‍රෝන 20 ට අඩු පොලිතීන් බෑග් හා ආහාර දැවටුම් විශ්වවිද්‍යාලය තුළට රැගෙන ඒම තහනම් කිරීම.

(ii) මයික්‍රෝන 20 ට වැඩි පොලිතීන් හා අනෙකුත් ද්‍රව්‍ය හා ප්ලාස්ටික් රැගෙන ඒම පාලනය කිරීම.

(iii) විශ්වවිද්‍යාලය තුළට ආහාර රැගෙන ඒමේදී ප්ලාස්ටික්,පොලිතීන් බෑග් සහ කෑම දවටන කොළ වෙනුවට වෙනත් පරිසර හිතකාමී ඇසුරුම් ක්‍රමවේද කෙරෙහි සිසුන් හා කාර්ය මණ්ඩලය දිරි ගැන්වීම.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් පාලනය | ආයතනයට ලැබෙන භාණ්ඩ වෙනුවෙන් භාණ්ඩ ලැබීම් තුණ්ඩු නිකුත් නොකිරීම. |
| (ආ) ගිණුම්කරණය | ඒකාකාරි ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය නොකිරීම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති නිවැරදිව භාවිතා නොකිරීම,ගෙවිය යුතු වියදම් සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබීම, ආදායම නිවැරදිව ගිණුම්ගත නොකිරීම, වියදම් නොවූ ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබීම හා මුදල් ප්‍රවාහ නිවැරදිව හඳුනා නොගැනීම. |

| | |
|---|---|
| (ඇ) මුදල් හා බැංකු කටයුතු | ලැබිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කර නොගැනීම, රාජකාරී බැංකු ගිණුම් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා නොගැනීම,බැංකු ජංගම ගිණුම් වලට අදාලව මුදල් පොත්වල ශේෂය අයිරාවක් වී තිබීම හා නිකුත් කර කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබීම. |
| (ඈ) අත්තිකාරම් කටයුතු | අත්තිකාරම් පියවා නොතිබීම, |
| (ඉ) කාර්ය මණ්ඩල කළමනාකරණය | තනතුරු පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු නොකිරීම, තනතුරු පුරප්පාඩු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තු අනුමැතිය ලබා ගෙන නොතිබීම. |
| (ඊ) අයවැය පාලනය | නිශ්චිත පුරෝකථනයකින් තොරව අයවැය ලේඛන පිළියෙල කිරීම හා අයවැය ගත ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා පසු විපරම් කටයුතු කර ඒ අනුව අයවැය සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබීම. |
| (උ) කොන්ත්‍රාත් පරිපාලනය | ගොඩනැගිලි ඉදිකිරීම් වල ගුණාත්මකභාවය සහතික නොකිරීම. |